**ශීර්ෂය - 420 - පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

**------------------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------------

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 08 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 16 දින ගණන්දීමේ නිලධාරි වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය

යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) 2020 වර්ෂයේ ආරම්භ කළ නව වැය ශීර්ෂයක් වන බැවින් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැති බව,

(ආ) ඉකුත් වර්ෂයේ මෙම වැය ශීර්ෂය හඳුන්වා දී නොතිබුණු බැවින් මා විසින් නිර්දේශ ලබා දී නොමැති බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06හි 7(II) ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරන ලද ආදායම් වෙනත් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතුව තිබුණි. අමාත්‍යාංශයේ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් අදාළ ආදායම් සංකේත 6ක් යටතේ අමාත්‍යාංශය විසින් එකතු කළ ආදායම රු.13,452,010ක් වී තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම ලැබීම් රු.163,225,215ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.149,773,204ක් වැඩියෙන් දක්වා තිබුණි. | රු.13,452,010 යනු සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ කාලයට පමණක් වූ, වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අදාළ ආදායම් එකතු කිරීම් පමණක් වන අතර, ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මුළු වර්ෂයට අදාළව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අදාළ ආදායම් එකතු කිරීම් ඇතුළුව අදාළ වෙනත් ලැබීම්වල වටිනාකම රු.163,225,215 වන බැවින් අදාළ සටහන් කිරීම නිවැරදි වේ. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06හි 7(vi) (ආ) ඡේදය අනුව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වැය විෂයයන් හෝ අනෙකුත් ප්‍රධාන ලෙජර් වියදම් යටතේ දරන ලද වියදම් අක්මුදල් ගැලපුම් ගිණුමේ හර පැත්තට ඇතුළත් කළ යුතුය. අමාත්‍යාංශය විසින් පසුව ඉදිරිපත් කළ අක්මුදල් ගැලපුම් ගිණුමේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.269,998,972,040ක් ලෙස හර කර තිබුණ ද අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුම අනුව එම වියදම රු.96,419,491,147ක් වීමෙන් වෙනස රු.173,579,480,893ක් විය. | අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව රු.96,419,491,147ක් වශයෙන් දක්වා ඇති මුදල තුළ ඇතුළත් වන්නේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා වියදම පමණි. රු.173,579,480,893ක් වූ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා වූ වියදම සමඟ වර්ෂය තුළ දරන ලද මුළු වියදම රු.269,998,972,040ක් වීම නිවැරදි වේ. | එම |
| (ඇ) | ඉහත සඳහන් මාර්ගෝපදේශයේ 7(vi)(ආ) ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයේ සඳහන් සංඛ්‍යා හා අමාත්‍යාංශයේ පොත් අනුව වූ සංඛ්‍යා අතර වෙනස්කම් තිබෙන විට එම වෙනස්කම් අක්මුදල් ගැලපුම් ගිණුමෙන් ගැලපිය යුතු ය. අමාත්‍යාංශයේ විස්තරාත්මක ශේෂ පිරික්සුම හා භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ගෙවීම් සහ ලැබීම් පිළිවෙළින් රු.25,868,251ක් හා 15,332,319ක් වූයෙන් වෙනස අක්මුදල් ගැලපුම් ගිණුමට හර කළ යුතු නමුත් ඉදිරිපත් කළ ගැලපුම් ගිණුමේ රු.1,737,593,475ක් හර වශයෙන් ද, රු.1,697,332,558ක් බැර වශයෙන් ද සටහන් කර තිබුණි. | ඉහතින් ද විස්තර කළ පරිදි, 2020 වර්ෂයේ මුළු අත්තිකාරම් ගෙවීම් හා ලැබීම් පදනම් කර ගිණුම් සකස් කර ඇති අතර, පිළිවෙළින් රු.25,868,251ක් හා රු.15,332,319ක් වූ අත්තිකාරම් ගෙවීම් හා ලැබීම් වර්ෂයේ මුල් මාස 08 තුළ වූ අත්තිකාරම් ගනුදෙනුවලට පමණක් අයත් වේ. | එම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 06හි 7(vi)(අ) අනුව අක්මුදල් ගැලපුම් ගිණුමේ බැරට වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් මු.රෙ.208 යටතේ මෙම අමාත්‍යාංශ වෙනුවෙන් දරන ලද වියදම සටහන් කළ යුතු ය. අමාත්‍යාංශය ඉදිරිපත් කළ අක්මුදල් ගැලපුම් ගිණුමේ එම වියදම රු.27,826,870,233ක් වශයෙන් බැර කර තිබුණි. නමුත් අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුම අනුව එම වියදම රු.96,419,491,147ක් විය. ඒ අනුව රු.68,592,620,914ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව, මු.රෙ. 208 යටතේ මෙම අමාත්‍යාංශය වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු දරන ලද වියදම් අක්මුදල් ගැලපුම් ගිණුමේ සටහන් කළ යුතුය. ඒ අනුව, මෙම අමාත්‍යාංශය වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ දරන ලද වියදම රු.27,826,870,233කි. විගණන වාර්තාවේ සඳහන් වන රු.96,419,491,147ක වියදම වෙනත් අමාත්‍යාංශ වෙනුවෙන් වර්ෂයේ අවසාන මාස 04ක කාලපරිච්ඡේදය සඳහා මෙම අමාත්‍යාංශය විසින් දරන ලද වියදමයි. | එම |
| (ඉ) | ඉහත මාර්ගෝපදේශයේ 7(vi)(ආ) ප්‍රකාරව අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව තැන්පතු ලැබීම් හා ගෙවීම් අතර වෙනස්කම් වේ නම් එය අක්මුදල් ගිණුමේ ගැලපුම් කළ යුතු ය. අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුම හා භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශ අනුව ලැබීම් හා ගෙවීම් සංඛ්‍යා අතර පිළිවෙලින් රු.138,108,361ක් හා රු.73,815,042ක් වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය. | තැන්පත් ගිණුමේ ශේෂයන් අමාත්‍යාංශ පොත්, සිගාස් මෘදුකාංග පිටපත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ සැසඳෙන බැවින් විගණන විමසුමේ සඳහන් පරිදි අක්මුදල් ගැලපුම් ගිණුමෙහි සටහනක් ඇතුළත් කර නැත. | එම |

### 1.6.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ ශීර්ෂ 155 යටතේ පැවති අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය 2020 සැප්තැම්බර් 01 දින සිට ශීර්ෂ 420 යටතේ පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ලෙස සංශෝධනය කර තිබුණි. රාජ්‍ය අමාත්‍යාංශය ඉකුත් වර්ෂයේ නොපැවතුණත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉකුත් වර්ෂයේ වියදම් හා ආදායම් ලෙස ඉකුත් වර්ෂයේ පැවැති ශීර්ෂ 155 අමාත්‍යාංශයේ සංඛ්‍යා පදනම් කරගෙන සංසන්දනාත්මකව දක්වා තිබුණි. | 2020 අගෝස්තු 09 දින නිකුත් කරන ලද අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව අමාත්‍යාංශවල විෂයපථයන් සංශෝධනය වූ අතර, මෙම අමාත්‍යාංශය ද නව වැය ශීර්ෂයක් යටතේ ස්ථාපිත විය. ඔබ සඳහන් කර ඇති පරිදි, නව වැය ශීර්ෂය යටතේ ගිණුම් සකස් කළ යුතුය.<br><br>රාජ්‍ය ආයතනවල අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමට අදාල, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020ට අනුකූලව නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 06හි 3 ඡේදයේ උපදෙස් අනුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන 2020 වසර සඳහා වූ අවසාන ගිණුම් ප්‍රකාශන හා ඊට අමුණා ඉදිරිපත් කරන වගුවල අන්තර්ගත සංඛ්‍යා පදනම් කරගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.<br><br>වැය ශීර්ෂ වෙනස් වුව ද වාර්ෂික ඇස්තමේන්තුවේ වැය ශීර්ෂ 155 තුළ පැහැදිලිව බෙදා වෙන් කළ හැකිවූ පරිදි කිසිදු වියදමක් ඒකාබද්ධව දරා නොමැති බැවින් මෙම සංසන්දනය මුළුමනින් ම නිවැරදි වූවක් වේ. විගණනය විසින් පෙන්වා දෙන කරුණ ඇතැම් අමාත්‍යාංශවලට නිවැරදි වුව ද මෙම අමාත්‍යාංශයට අදාල නොවන බව ද නිරීක්ෂණය කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

## 1.6.3 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්**<br>2020 අගෝස්තු 31 දිනට අංක 155 දරන වැය ශීර්ෂය යටතේ පැවති අග්‍රිම ශේෂය රු.403,555,559ක් වූ අතර එම මුදල ජ'නල් සටහන් මගින් වැය ශීර්ෂ 420 යටතට මාරු කර තිබුණි. එම අග්‍රිමය තුළ ඉන් වෙන්ව ගිය අමාත්‍යාංශවලට ලබා දී තිබූ අග්‍රිම රු.22,343,734ක් ද ඇතුළත් වූයෙන් 420 ශීර්ෂය සඳහා රු.381,211,825ක් ඉතිරිව තිබුණි. 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබී ඇති අග්‍රිම රු.97,930,292,990ක් වූයෙන් මෙම 420 ශීර්ෂය සඳහා ලැබී ඇති මුළු අග්‍රිම වටිනාකම රු.98,311,504,814ක් විය. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.273,124,512,657ක් වශයෙන් රු.174,813,007,843ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂය ආරම්භයේ සිට අවසානය දක්වා ම මෙම අමාත්‍යාංශය වෙත මහා භාණ්ඩාගාරය විසින් අක්මුදල් නිදහස් කර ඇත්තේ අග්‍රිම ගිණුම් අංක 7002/0/0/0/449/20 හා 7003/0/0/0/44/20 යටතේ ය.<br><br>විගණන විමසුම සමඟ ඉදිරිපත් කළ පැහැදිලි කිරීම ද අනුව, වර්ෂය තුළ ඉහත අග්‍රිම ගිණුම් අංක යටතේ ලද අක්මුදල් ප්‍රමාණය සහ වෙනත් මූලාශ්‍රවලින් ලද මුදල් එකතුව ඇතුළත්ව අමාත්‍යාංශයේ මුළු අග්‍රිම ලැබීම රු.273,124,512,657කි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| **(ආ) අග්‍රිම ශේෂය**<br>මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ලෙස රු.242,214,173,832ක් දක්වා තිබුණ ද ඉහත සඳහන් පරිදි නිවැරදි ලෙස ගැලපූ විට 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.67,251,392,785ක් විය යුතු විය. | ඉහතින් විස්තර කර ඇති පරිදි, වාර්ෂික අග්‍රිම ශේෂය රු.242,214,173,832ක් ලෙස දැක්වීම නිවැරදි වේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

## 1.6.4 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අපහරණ ලැයිස්තුව අනුව අපහරණය කළ අයිතම 176කට අදාළ පිරිවැය රු.3,987,094ක් විය. නමුත් මූල්‍ය නොවන වත්කම් ඉවත්කිරීම් ලෙස ගිණුම්වලට රු.3,852,950ක් ගෙන තිබුණි. ඒ අනුව වෙනස රු.134,144 ක් විය. | අදාළ වෙනස සිගාස් පරිගණක පද්ධතියට සටහන් අතුළත් කිරීමේදී සිදුවූ දෝෂයක් වන අතර, පසුව එය නිවැරදි කර ඇත. ඒ අනුව, නිවැරදි අපහරණ පිරිවැය රු.3,852,950ක් වන අතර, අමාත්‍යාංශ පොත්වල මෙම අගය නිවැරදිව දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

## 1.6.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් රු.1,254,014ක් වුව ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.2,662,794,451ක් ලෙස දක්වා තිබුණි. | වැය විෂය අංක 2102, 2103 යටතේ අත්පත් කරගැනීම් හැර අනෙකුත් සියලු ප්‍රාග්ධන වැය විෂයයන් වෙනුවෙන් දරන ලද වියදම් භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස සටහන් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

## 1.6.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

-----------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | අමාත්‍යාංශයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක හරහා පවතින අභ්‍යන්තර පාලන පද්ධති නැවත සමාලෝචනය කර වරින්වර අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම හා යාවත්කාලීන කිරීම් සිදු කරනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.10 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | එම |
| (ඇ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාව ඉටු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | එම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩසටහන් අංක 1 සහ 2 යටතේ ප්‍රාග්ධන වැය විෂයයන් 6කට සලසා තිබූ ප්‍රතිපාදන පිළිවෙලින් රු.1,900,000ක් හා රු.70,100,000ක් වශයෙන් රු.72,000,000ක් වූ මුළු ප්‍රතිපාදනය ම එනම් ප්‍රතිශතයක් වශයෙන් සියයට සියයක් ඉතිරි වී තිබුණි. | රටෙහි පැවති අයහපත් වාතාවරණය, රාජ්‍ය ඇමතිවරයා ඉවත්වීම සහ කාර්යාල නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා සහ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ගැටළු නිසා ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වීම, මඩකලපුව මහජන පුස්තකාලය ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළදී ලබා නොගැනීම නිසා ද ප්‍රතිපාදන ඉතිරි විය. | ඇස්තමේන්තු සකස් කිරීමේදී අතාත්ත්වික නොවන පරිදි පිළියෙල කිරීමට කළමනාකාරිත්වයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) | වැඩසටහන් අංක 1 යටතේ ප්‍රාග්ධන වැය විෂයයන් 5කට සලසා තිබූ රු.29,940,000ක ප්‍රතිපාදනයෙන් රු.18,340,272ක් එනම් ප්‍රතිශතයක් වශයෙන් සියයට 61ක් ඉතිරි වී තිබුණි. | අංක 420-1-1-2102 වැය විෂයයේ ඉතිරිය ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය වර්ෂය පුරා ක්‍රියාත්මක නොවීම නිසා ඉතිරි විය. අංක 420-1-2-0-2001,420-1-2-0-2002 සහ 420-1-2-0-2003 යන වැය විෂයයන් රටේ පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත් පිරිනැමීමේ ගැටළු හා කාර්යාලය නිසිපරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මෙම වියදම් දැරීම අවම වී ඇත. එසේම පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට හා අමාත්‍යාංශයට පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීමෙන් 2401 සහ 2201 ප්‍රතිපාදන ඉතිරි විය. | එම |
| (ඇ) | වැඩසටහන් අංක 02 යටතේ ප්‍රාග්ධන වැය විෂයයන් 11කට සලසා තිබූ රු.3,240,860,000ක ප්‍රතිපාදනයෙන් රු.1,943,180,815ක් එනම් ප්‍රතිශතයක් වශයෙන් සියයට 60ක් ඉතිරි වී තිබුණි. | රට තුළ පැවති අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත දෛනික කටයුතු අඩපණ වීම නිසා සහ අපේක්ෂිත පරිදි මාර්ග සංවර්ධනය කිරීමේ කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි විය. | එම |
| (ඈ) | භාණ්ඩාගාර සටහන් අනුව 2020 වර්ෂයේ 420-2-3-19-2506(12) වැය විෂයයට අදාළ මුළු වියදම රු.504,074,405ක් විය. 2019 වර්ෂයේ එම වැය විෂයය හැඳින්වීමේ සංකේතය 155-2-3-29-2506-12 වන අතර එහි සඳහන් මුළු වියදම රු.100,669,665ක් විය. එම සංකේතයෙන් හැඳින්වූ ප්‍රවාහන | ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය විසින් 2019 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. පසුව විගණනයෙන් ලැබුණු උපදෙස් අනුව | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වේ. |

| | |
|---|---|
| සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය විසින් රු.81,546,770ක ස්ථානගත කිරීමේ අත්තිකාරම් මුදල් 2019 වර්ෂය තුළ දැරූ වියදමට එකතු කිරීම නිසා 2019 වර්ෂයේ වියදම රු.81,546,770ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ සත්‍ය වියදම රු.585,621,175ක් විය යුතු වුව ද පසුගිය වර්ෂයේ ගෙවන ලද අත්තිකාරම් මුදල වන රු.81,546,771ක මුදල වැය විෂයයට අධිභාර කිරීම හේතුවෙන් සත්‍ය වියදම රු.81,546,771ක් අඩුවෙන් සටහන් කර තිබූ බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේදී එම අත්තිකාරම් ගෙවීම් අත්තිකාරම් ගිණුමකට මාරු කර ඇත. අදාළ ගැලපීම හේතුවෙන් 2019 වර්ෂයේදී වැඩිපුර හර කරන ලද වියදම ඉවත්ව ඇති අතර සමස්ත වියදම නිවැරදි වේ. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

-------------------------------------

බැරකම් හා බැඳීම්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 හා 2017 අප්‍රේල් 27 දිනැති චක්‍රලේඛයේ 02 (අ) ඡේදය පරිදි පුද්ගලික පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුළ ප්‍රථමයෙන් බැඳීම් හඳුනාගත යුතුය. එම චක්‍රලේඛයේ 02(ආ) පරිදි එසේ හඳුනාගනු ලැබූ බැඳීම් පදනම් කරගෙන එම බැඳීම්වලට අදාළ භාණ්ඩ හා සේවා ලබාගත් පසු ඒ සඳහා ගෙවීමට ඇති මුදල් හා ගිවිසුම්වලට එළඹෙන ලද කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් සහතික කළ වැඩවල වටිනාකම බැරකමක් ලෙස සටහන් කළ යුතු වුව ද ඊට පටහැනිව අංක 420-1-2-0-1002 දරන වැය විෂයය යටතේ රු.527,452ක් බැඳීම් ශේෂය ලෙස දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 05/2020හි 4.11 ඡේදයේ උපදෙස් පරිදි 2020 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන හරහා අමාත්‍යාංශයේ බැඳීම් වාර්තා කරන ලදී. ඒ අනුව, 2020 දෙසැම්බර් 31 දින වනවිට ගිණුම් අංශය වෙත අංක 420-1-2-0-1002 වැය විෂයය යටතේ ගෙවීම සඳහා වවුචර් ඉදිරිපත් කර නොතිබුණු බැවින් හා ඉහත පරිදි සිගාස් වැඩසටහන හරහා බැඳීම් වාර්තා කළ බැවින් මෙම වියදම බැඳීම් ලෙස වාර්තා කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි උපදෙස් නොසලකා වැය විෂයයන් 7ක ප්‍රතිපාදන ඉතිරිය රු.119,401,526කින් ඉක්මවා රු.257,693,824 බැඳීම්වලට එළඹී තිබුණි. | පහත සඳහන් වැය විෂයයන් සඳහා 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රමාණවත් ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, වර්ෂය අවසානයේදී එම ඉතිරි ප්‍රතිපාදන වඩාත් ඵලදායීව උපයෝජනය කළ හැකිවන පරිදි, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු ඇත.<br><br>420-2-03-000-1508<br>420-2-03-000-2202/14<br>420-2-03-29-2202 | මුදල් රෙගුලාසි 94(I) විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |

එසේ ම පහත සඳහන් වැය විෂයයන් යටතේ 2020 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන හරහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට වාර්තා කරන ලද බැදීම් වාර්තාවේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැදීම් ඇතුළත් කර නොමැත.

420-2-03-027-2202
420-2-03-024-2202
420-2-03-000-2202/10
420-2-03-020-250

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.571(3) ප්‍රකාරව වර්ෂ දෙකකට වැඩි තැන්පතු රජයේ ආදායමට බැර කළ යුතු නමුත් තැන්පතු ගිණුම් ශේෂ 328 ක රු.91,713,104 ක් රජයේ ආදායමට බැර කර නොතිබුණි. | වර්ෂ දෙකකට වැඩි තැන්පතු තුළ ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ, කොන්ත්‍රාත් බිල්වලින් අඩු කර ගන්නා ලද සියයට 10 රඳවුම් මුදල් වන අතර, මෙම මුදල් නිදහස් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරුන් මඟින් අදාළ ඉල්ලීම් ඉදිරිපත් විය යුතුව ඇති බැවින් එම ක්‍රියාවලිය සඳහා තරමක කාලයක් ගත වේ. කෙසේ වුව ද මේ වනවිට කාලය ඉක්මවූ තැන්පතු සියල්ල රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි 571(3) විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2017 ජනවාරි 20 දිනැති අංක 03/2017/පාලන දරන අභ්‍යන්තර චක්‍රලේඛය | (i) | සන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂවරයා සහ සහකාර අධ්‍යක්ෂවරයා 2020 අප්‍රේල් 22 සිට සැප්තැම්බර් 30 දක්වා ඔවුන්ගේ රාජකාරියට පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය හෝ පැමිණීමේ ලේඛනය භාවිතා කර නොතිබුණ ද ඔවුන්ට වැටුප් හා අනෙකුත් දීමනා වශයෙන් රු.1,218,580ක් ගෙවා තිබුණි. | අදාල කාලසීමාව තුළ එම නිලධාරීන් විසින් තම රාජකාරි ආවරණය කර ඇති බැවින් ඔවුන්ට හිමි වැටුප් ගෙවා ඇත.<br>එම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය . |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | (ii) | අතිරේක ලේකම් (ව්‍යාපෘති) විසින් 2018 ඔක්තෝබර් 18 දින සිට 2020 දෙසැම්බර් 11 (විගණිත දිනය) දක්වා පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිත කර නොතිබුණි. | එම | එම |
| | | (iii) | මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, 10 දෙනෙකුගෙන් යුක්ත කාර්යමණ්ඩලයකින් හා තනිපුද්ගල උපදේශකවරුන් 04 දෙනෙකුගෙන් සමන්විතව පවත්වාගෙන ගිය ද පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා චක්‍රලේඛ උපදෙස් පරිදි ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිත කර නොතිබුණි. | එම | එම |
| **(ආ)** | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | (i) | චක්‍රලේඛයේ 2.3.3(C) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු එක් සංවර්ධන ව්‍යාපෘතියක වැඩ බැලීමේ තනතුරක පමණක් සේවයෙහි නියුතු කළ හැකි වුව ද චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පුරනැගුම ව්‍යාපෘතිය, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සහ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල පිළිවෙලින් පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ, නියෝජ්‍ය පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ (මාර්ග හා ජල) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ යන වැඩ බැලීමේ තනතුරු තුනක් සඳහා පත්කර එයින් තනතුරු දෙකක් සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,346,109ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද වැටුප් අය කිරීමට කටයුතු කර ඇත. | එම |

| | | | | |
|---|---|---|---|---|
| | | (ii) චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් මාස දෙකකට වරක් ලෙස වසරකට ව්‍යාපෘති මෙහෙයුම් කමිටු 06ක් පැවැත්විය යුතු වුවත් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 9න් ව්‍යාපෘති 2ක් සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් 2 බැගින් පවත්වා තිබූ අතර අනෙකුත් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් එක බැගින් පමණක් පවත්වා තිබුණි. | පැවති වාතාවරණය තුළ ඇතැම් අවස්ථාවලදී ව්‍යාපෘති මෙහෙයුම් කමිටු පැවැත්වීම ප්‍රමාද වුව ද නිසි පරිදි මෙම රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | එම |
| (ඇ) | 2020 සැප්තැම්බර් 04 දිනැති අංක DMS/SM/10 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | නව රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා අනුමත කර ඇති වැටුප් හා දීමනාවලට පටහැනිව එම අංශයේ සේවයේ නියුතු අතිරේක ලේකම්වරයාට වැටුපෙන් සියයට 50ක් එනම් මාසිකව රු.56,150ක් බැගින් සහ ප්‍රසම්පාදන විශේෂඥවරයාට සහ ඉංජිනේරු උපදේශක (වාරිමාර්ග) සඳහා එක් නිලධාරියෙකුට මාසිකව රු.107,000ක් බැගින් 2020 සැප්තැම්බර් මාසයේ සිට වැඩිපුර වැටුප් ලෙස රු.1,080,600ක් ගෙවා තිබුණි. | අදාළ දීමනා ගෙවීම මේ වනවිට අත්හිටුවා ඇති අතර, වැඩිපුර ගෙවීම් ඇත්නම් අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් දී ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 පෙබරවාරි 05 දිනැති, අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය | (i) චක්‍රලේඛයේ අනු අංක 1.12 ප්‍රකාරව සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබා දීමේදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට පමණක් මෝටර් රථ බලපත්‍ර ලබා දිය යුතු වුව ද පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත සහ පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත රජයේ සංවර්ධන ව්‍යාපෘතිවල වසර 9ක සේවා කාලයක් සම්පූර්ණ නොකළ ද මෝටර් රථ බලපත්‍ර නිකුත් කර තිබුණි. | පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා වසර 9ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවට ලේඛන පරීක්ෂා කිරීමෙන් තහවුරු කරගෙන ඇත. 1/2018 චක්‍රලේඛයේ 1.1 හා 1.12 අනුව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත. පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකවරයා සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | (ii) චක්‍රලේඛයේ 9.2 ඡේදය අනුව සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කිරීම සෑම ලේකම්වරයකුගේම වගකීම වන බව සඳහන් වුව ද ලේකම්වරයා වගකීම ඉටුවන ආකාරයට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය |
| (ඉ) | අංක 01/2013 දරන වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය 01.02 (iv) | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු හා අනුකූලතා නිලධාරි වශයෙන් සේවය කරන නිලධාරියාගේ සේවා කාලය සම්පූර්ණ වී තිබුණ ද මෙම චක්‍රලේඛයේ 01.02(iv) ඡේදය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් පසුව කොන්ත්‍රාත් පදනම මත මෙම චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් ලබන තනතුරක් සඳහා පත් කර ඇති නිලධාරීන්ට සහනදායී පදනමට මෝටර් රථ බලපත්‍ර හිමි නැති බවට උපදෙස් ලබා දී තිබියදී මෝටර් රථ බලපත්‍රයක් ලබා දී තිබුණි. | අදහස් දක්වා නොමැත. | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 4.2.1 | ඉදිරි වර්ෂ 3ක කාලය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2.5 අවිධිමත් ගනුදෙනු

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් 155 වැය ශීර්ෂයේ වැය විෂයයන් 11ක ප්‍රතිපාදනවලින් රු.4,764,389ක් වියදම් දරා තිබුණි. 2020 සැප්තැම්බර් 01 දින සිට නව වැය ශීර්ෂයන් යටතේ ගිණුම් කටයුතු ආරම්භ කිරීමෙන් පසු 155 වැය ශීර්ෂය යටතේ වියදම් කළ මුදල ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට පවරා ගන්නා ලෙස දැන්වූව ද එම අමාත්‍යාංශය විසින් පවරා ගෙන නොතිබුණි. ඒ අනුව ශීර්ෂය 420 යටතේ වියදම් දැරීමට බලය නොලත් රු.4,764,389ක් එම වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය. | භාණ්ඩාගාරයෙන් ලැබුණු උපදෙස් පරිදි අදාළ ගනුදෙනු ගිණුම්වලට ඇතුළත් කර ඇත. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අනුමත අයවැය ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීම පෙරදැරි කරගෙන ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණු අතර වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් නිශ්චිතව සඳහන් කර නොතිබුණි. | අයවැය ඇස්තමේන්තුවට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර ඇති අතර, ඉදිරියේදී වඩාත් නිශ්චිතව කාර්යයන් හඳුනාගන්නා ලෙස අවශ්‍ය උපදෙස් දී ඇත. | සමාලෝචිත වර්ෂයට පසු වර්ෂවල සැලසුම් සාර්ථක කර ගැනීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතු වේ. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංවර්ධන අංශය හා පළාත් පාලන අංශයට අදාළව ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් නිශ්චිතව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබීම හේතුවෙන් ප්‍රගතිය හඳුනාගත නොහැකි විය. | අඩුපාඩු ඇත්නම් නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් දීමට සටහන් කර ගතිමි. | නිවැරදි ක්‍රියාකාරී සැලැස්මක් මෙන් ම ඊට අනුකූලව ප්‍රගති වාර්තාවක් ද සකස් කළ යුතුය. |

### 3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2017 වර්ෂයේදී රු.මිලියන 935.69ක වියදමෙන් මිලදී ගත් කවෂිමා කොම්පෝස්ට් යන්ත්‍ර 9න් 4ක් සවි කිරීම සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කර නොතිබිම හේතුවෙන් එම යන්ත්‍ර භාවිතයට ගැනීමට 2021 ජුනි 30 වන විටත් අපොහොසත් ව තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් මෙම ඉදිකිරීම් ප්‍රමාද වූ අතර, මේ වනවිට එම කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇත. | ගිවිසුම්ගත කාලපරිච්ඡේදය තුළ ඉදිකිරීම් නිමකරවා ගැනීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) | අඩ්ඩාලච්චේන - අෂ්රොෆ් නගර්හි සවි කළ යන්ත්‍රය තාවකාලිකව වසා දමා ඇති අතර ගාල්ල හා වඩමාරච්චි යන නගර දෙකෙහි ස්ථාපිත කර ඇති යන්ත්‍ර 02හි නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා තාවකාලිකව කසළ ගෙන ඒම නතර කර ඇත. | වසංගත තත්ත්වයන් යටතේ වුව ද කසළ එකතු කිරීම හා ප්‍රතිචක්‍රීයකරණය කිරීම කළ යුතු වේ. |

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ මිලදී ගත් කොම්පෝස්ට් යන්ත්‍ර 9 අතුරින් 5ක් කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදා ගෙන තිබුණ ද එම යන්ත්‍ර මගින් දිනකට අපේක්ෂිත නිෂ්පාදන මට්ටම වූ කසළ ටොන් 50ක් භාවිතයෙන් ටොන් 17ක කොම්පෝස්ට් නිෂ්පාදනයක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | පරීක්ෂා කිරීමට සටහන් කර ගතිමි. | ආයෝජිත මුදලෙන් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර දීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | එක් කොම්පෝස්ට් යන්ත්‍රයකින් වාර්ෂිකව රු.මිලියන 80ක මූල්‍ය ප්‍රතිලාභයක් අපේක්ෂා කළ ද එවැනි මූල්‍ය ප්‍රතිලාභයක් අත්කර ගෙන නොතිබුණි. | කොම්පෝස්ට් යන්ත්‍ර ස්ථාපිත කිරීමේ ප්‍රමුඛ පරමාර්ථය කසළ ගැටළුවට පිළියම් සැපයීම වන අතර, මූල්‍ය ප්‍රතිලාභ එහි අතුරු ප්‍රතිඵලයකි. | එම |
| (ඇ) | ලංකාපුර, දඹුල්ල හා කුරුණෑගල යන ස්ථානවල පිහිටි කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍ර වෙත පිළිවෙලින් කසළ ටොන් 40, 25 හා 30ක ප්‍රමාණයක් ලැබෙන අතර දෛනික පොහොර නිෂ්පාදනය ටොන් 6-8, 5-6 හා 4-5 අතර ප්‍රමාණයක් ලෙස වාර්තා වුව ද ඉලක්කගත ධාරිතාවයට ළඟා වීමට එකම යන්ත්‍රයකට හෝ නොහැකි වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | එම |
| (ඈ) | හම්බන්තොට - කැළියපුර හා කෑගල්ල යන ස්ථාන 02හි ස්ථාපිත යන්ත්‍ර සඳහා දෛනිකව ලැබෙන කසළ ප්‍රමාණය ඉතා අවම මට්ටමක පවතින අතර එම ප්‍රමාණය පිළිවෙලින් ටොන් 2-3ක් හා ටොන් 7ක් වශයෙන් විය. එම යන්ත්‍ර 02න් කොම්පෝස්ට් නිෂ්පාදනයක් සිදු කර නොතිබුණි. | කොම්පෝස්ට් නිෂ්පාදනයට ප්‍රමාණවත් පරිදි කසළ නොලැබීම | එම |
| (ඉ) | කොම්පෝස්ට් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා මේ වන විට මිලදී ගෙන ස්ථාපිත කර ඇති යන්ත්‍රවලට අමතරව තවත් යන්ත්‍ර 12ක් මිලදී ගැනීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. ස්ථාපිත කර ඇති යන්ත්‍ර ඌන උපයෝජිතව පැවතියදී තවත් යන්ත්‍ර මිලදී ගැනීම අනාර්ථික වියදමක් බවට පත්වීමට ඉඩ තිබෙන බව නිරීක්ෂණය කෙරේ. | අදහස් දක්වා නොමැත. | නව යන්ත්‍ර මිලදී ගැනීමට පෙර මිලදී ගත් යන්ත්‍රවලින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ශ්‍රී පාදස්ථානයේ ගිමන්හල**<br>ශ්‍රී පාදස්ථාන පූජා භූමියේ ඉදිකිරීමට යෝජිත ගිමන්හල සඳහා රු.මිලියන 54.59ක ඇස්තමේන්තුවක් 2019 වර්ෂයේදී සකස් කර තිබුණ ද ඇස්මේන්තුව සකස් කරන අවස්ථාවේ දී භාණ්ඩ ප්‍රවාහන අපහසුතා පිළිබඳ අවධානය යොමු නොකිරීම හේතුවෙන් පසුව භාණ්ඩ ප්‍රවාහන දුෂ්කරතාව මත ඇස්තමේන්තුව රු.මිලියන182.99ක් දක්වා වැඩිකර තිබුණි. මෙම කාර්යය 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට පවා ඇතුළත් කර නොතිබූ අතර ප්‍රගතිය වාර්තා නොවීය. | වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් දැනට මෙම ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. | ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නිවැරදි තොරතුරු ප්‍රගති වාර්තාවට ඇතුළත් කළ යුතුය. |
| **(ආ) මඩු දේවස්ථානය ආශ්‍රිත ගිමන්හල**<br>කොන්ත්‍රාත්කරු තෝරා ගත් බව සඳහන් කර තිබුණු නමුත් ගිවිසුම්ගත වීමක් සිදුකර නොතිබුණු අතර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ක්‍රියාත්මක නොමැති බව ප්‍රගති වාර්තාවේ සඳහන් කර තිබුණි. | නිවැරදියි | සංවර්ධන කාර්යයන් කාර්යක්ෂමව සිදු කළ යුතු වේ. |
| **(ඇ) කෝනේශ්වරම් ගිමන්හල**<br>2020 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර ප්‍රගතිය ද වාර්තා නොවිය. | ප්‍රතිපාදන වෙන් නොවීම මත ව්‍යාපෘතිය නතර කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නිවැරදි තොරතුරු වාර්තා කළ යුතු වේ. |
| **(ඈ)** බෙලිඅත්ත නාගරික පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා අත්තිකාරම් මුදලක් ලෙස 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රු.මිලියන 68ක් ගෙවා තිබූ නමුත් කිසිදු ඉදිකිරීමක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2014 වර්ෂයේ සිදු වූ දේශපාලන වෙනස් වීම මත 2014 වසරින් පසු ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොමැති වුවත් සංස්ථාව ඉටුකරන ලද කාර්යයන්ට අදාළව රු.මිලියන 1.1ක් වූ බිල්පත ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සහතික කර නැත. ඉතිරි මුදල වූ රු.මිලියන 66.8ක් තවදුරටත් අයකර ගත යුතුව ඇත. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වූ ගබඩාව වෙනුවෙන් සංස්ථාවෙන් බදු පදනම මත ලබාගෙන ඇති රු.මිලියන 25.95 හිලව් කිරීමට ද තීරණය කර ඇත. | ලැබිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

-----------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) අනුරාධපුර පහසුකම් මධ්‍යස්ථානය**<br>භෞතික ප්‍රගති වාර්තාව අනුව ප්‍රගතිය සියයට 100ක් ලෙස දක්වා තිබුණ ද වැඩ නිමකළ බවට විගණනයේදී තහවුරු නොවිය. | ප්‍රධාන කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කර ඇති අතර, පවතින වාතාවරණය තුළ නළ ළිඳට අවශ්‍ය වතුර මෝටරය මිලදී ගැනීමට නොහැකි වීම නිසා එම කාර්යය පමණක් ප්‍රමාද වී ඇත. | නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| **(ආ) මඩකලපුව පුස්තකාලය**<br>මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ ඉතිරි වී ඇති වැඩ අවසන් කිරීම සඳහා රු.මි. 169.97ක ප්‍රතිපාදන ලබාදීමට 2018 සැප්තැම්බර් 19 දිනැති අංක 18/2053/805/064 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමේ කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පත් කොට තිබුණු අතර එම දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 345ක් විය. 2019 වර්ෂයේ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ රු.මිලියන 100ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 50ක් ලබා දී තිබූ අතර එම ප්‍රතිපාදනවලින් වැය කර තිබුණේ රු.148,017කි. 2020 වර්ෂය සඳහා රු.මිලියන 10ක ප්‍රතිපාදන වෙන් කර එම මුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණ ද 2020 භෞතික ප්‍රගති වාර්තාව අනුව කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ කටයුතු සිදු කර ඇති බව සඳහන් වුව ද 2020 වර්ෂයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රගතියක් නොමැති විය. | මේ වනවිට අදාල ව්‍යාපෘතිය ප්‍රදානය කර ක්‍රියාත්මක වෙමින් පවතී. | සංවර්ධන කාර්යයන් කාර්යක්ෂමව ඉටු කළ යුතු වේ. |

## 3.7 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM)** | | |
| ලෝක බැංකු ණය මුදලක් මගින් මූල්‍යයනය කරනු ලබන පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සඳහා රු.මිලියන 3ක් ද, පළාත් 9 සඳහා රු.මිලියන 400ක් ද වෙන් කර තිබූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව වර්ෂයේ මුළු වියදම රු.මිලියන 310.92ක් විය. එහෙත් ව්‍යාපෘතිය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හෝ ව්‍යාපෘතියට අදාළ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම ව්‍යාපෘතියට අදාළ 2020 වර්ෂයේ අවසන් ගිණුම මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇත. | සමාලෝචිත වර්ෂය සඳහා අංග සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සහ ව්‍යාපෘතියට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| **(ආ) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)** | | |
| **i.** ව්‍යාපෘතියේ දෙවන ගිණුම් වර්ෂය වූ 2020 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 650.70ක් වෙන් කර තිබුණ ද වර්ෂයට වියදම රු.මිලියන 60.54ක් පමණක් වීමෙන් වර්ෂය තුළ සියයට 9.30ක තරම් ඉතා දුර්වල මූල්‍ය ප්‍රගතියක් පමණක් අත්කරගෙන ඇති බව නිරීක්ෂණය විය. | අදාළ අක්මුදල වර්ෂය තුළදී නිදහස් කර ගැනීමට නොහැකි වීමෙන් වර්ෂය තුළදී ව්‍යාපෘතියේ ප්‍රගතියක් අත්කර ගත නොහැකි විය. | අපේක්ෂිත කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **ii.** පූර්ණකාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විතව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මෙතෙක් ස්ථාපිත කර නොමැති අතර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කරන මෙම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි. තව ද ව්‍යාපෘතියේ ප්‍රාරම්භක කටයුතු සඳහා වැඩ බැලීමේ පදනම මත පත් කළ කාර්යමණ්ඩලයම ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකයේ කටයුතු වෙනුවෙන් ද අනුයුක්ත කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට අනුව මේ වන විට බඳවා ගැනීම් සිදු කර ඇත. | ව්‍යාපෘතියේ කාර්යසාධන මට්ටම පවත්වා ගැනීම සඳහා සුදුසු පරිදි කාර්යමණ්ඩලයක් පත්කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | උතුර, උතුරුමැද, නැගෙනහිර හා ඌව යන පළාත්වල පළාත් පාලන ආයතන මට්ටමෙන් සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් සකස් කිරීම සඳහා රු.මිලියන 4.93ක් වැය කර තිබුණි. පළාත් පාලන සහභාගීත්ව සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතාව අනුව පළමු ස්ථානය හිමිකර ගත් ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම සඳහා තෝරාගත යුතු වුවත් එසේ තෝරා නොගෙන ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේ උපදෙස් පරිදි මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. | අදාළ සැලැස්ම සමස්ත පළාත් පාලන ආයතනයේ අවශ්‍යතා වෙනුවෙන් සකස් කරන්නක් වන අතර, එහි සඳහන් උප ව්‍යාපෘති ඕනෑම අරමුදලක් යෙදවීමෙන් නිම කළ හැකි ය. ඒ අනුව එහි පළමු ව්‍යාපෘතිය මෙම ව්‍යාපෘතියෙන් නිම කළ යුතු ය යන්න අදාළ නොවේ. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| iv. | මෙම ව්‍යාපෘතියේ ප්‍රාරම්භක කටයුතු සඳහා පත් කළ උපදේශකවරුන් 4 දෙනෙකු විසින් ඉටුකළ යුතු කාර්යයන් නිම කර නොමැති වීමෙන් ගෙවන ලද රු.මිලියන 6.47ක මුදලක් නිශ්කාර්ය වියදමක් වී තිබූ බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ තවදුරටත් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, ඒ අනුව ඉදිරි තීරණ ගැනීමට නියමිත ය. | වියදම නිශ්කාර්ය නොවීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |
| **(ඇ)** | **යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රාරම්භක පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය (UPPF)** | | |
| i. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් අනුව කටයුතු නොකර සහ ප්‍රමාණවත් අධ්‍යයනයකින් තොරව එතෙක් නිර්මාණ සැලසුම් හා ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් මෙන් ම ව්‍යාපෘති කළමනාකරණ වියදම් එකතු වටිනාකම රු.මිලියන 169.06ක පාඩුවක් මත ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. | ව්‍යාපෘතිය අවසන් කිරීමට ලද උපදෙස් අනුව, විධිමත් පරිදි එහි කටයුතු අවසන් කර ඇත. මේ පිළිබඳව විස්තරාත්මක පිළිතුරු දැනටමත් විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | පාඩුව හඳුනාගෙන විධිමත් ලෙස කටයුතු කළ යුතුය. |
| ii. | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට වැටුප් ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන අනුව පිහිටවිය යුතු වැටුප් තලයේ නොපිහිටුවා මාසයකට රු.60,000ක් වැඩියෙන් මාස 16ක් සඳහා රු.960,000ක් වැඩිපුර ගෙවා තිබුණි. | ව්‍යාපෘති වටිනාකම සැලකිල්ලට ගෙන අදාළ වැටුප් ගෙවා ඇත. | අවිධිමත් ගෙවීම් සම්බන්ධව විධිමත් පියවර ගැනීම |
| iii. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව පුරනැගුම ව්‍යාපෘතියේ මූල්‍ය විශ්ලේෂකවරයා මෙම ව්‍යාපෘතියේ ගණකාධිකාරීවරයා ලෙස වැඩ බැලීමේ පදනම යටතේ පත්කර වැටුප් ලෙස රු.720,000ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රාරම්භක කටයුතු සඳහා වැඩ බැලීමේ පදනම මත මෙම නිලධාරියා පත් කර ඇත. | එම |

**(ඈ) පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක ප්‍රතිපාදන (**LGESP-AF)

| | | |
|---|---|---|
| **(i)** 2016 නොවැම්බර් 02 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අත්සන් කළ අංක 3431-**SRI(SF)** දරන ණය ගිවිසුම අනුව මෙම ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට අපේක්ෂා කෙරිණි. ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය අනුව මුල් මාස 18 තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනැමීමට හා පිරිනැමූ කොන්ත්‍රාත් එකී ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ වැඩ අවසන් කරවා ගැනීමට නොහැකි වීම නිසා 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කරවාගෙන තිබුණි. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ මූල්‍ය උපයෝජනය**,** මුළු ණය මුදල වූ ඇ.එ.ජ.ඩොලර් මිලියන 60න් ඇ.එ.ජ. ඩොලර් මිලියන 33.67ක් හෙවත් මුළු මුදලෙන් සියයට 56.11ක් වීමෙන් ඉතා දුර්වල මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය වූ අතර ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය පහළ යාම මූල්‍ය ප්‍රගතිය පහළ යාමට හේතුවක් ලෙසට ඉදිරිපත් කර තිබුණි. ඉහළ යන රුපියලේ වටිනාකම මත නව ව්‍යාපෘති හඳුනා ගනිමින් ප්‍රශස්ත ව්‍යාපෘති ප්‍රගතියක් අත්කර ගැනීමට ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ම අවස්ථාව තිබුණ ද ඒ අනුව කටයුතු නොකර 2023 මාර්තු 31 දක්වා ව්‍යාපෘති කාලපරිච්ඡේදය දීර්ඝ කරවා ගැනීමට කටයුතු කරමින් පවතින බව නිරීක්ෂණය විය. දින දීර්ඝ කිරීම හේතුවෙන් උපදේශක සමාගම් හා ව්‍යාපෘති කාර්යමණ්ඩල පවත්වා ගැනීම ඇතුළත් ව්‍යාපෘති මෙහෙයුම් වියදම සඳහා මසකට රු.මිලියන 80 බැගින් රු.මිලියන 2,640ක අමතර වියදමක් රජයට දැරීමට සිදුවන බව ද නිරීක්ෂණය විය. | පළාත් පාලන ආයතන වැඩි දියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැඟුම) අතිරේක ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන සිවිල් කොන්ත්‍රාත් විවිධ නොවැළැක්විය හැකි හේතු මත එනම් කොවිඩ් වසංගත තත්වය**,** කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාද සහ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි හේතුමත ප්‍රමාද වූ අතර**,** ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය මෙන් උපදේශක සමාගම්වල කාලය ද දීර්ඝ කිරීමට සිදුවී ඇත. | නියමිත කාලපරිච්ඡේදය තුළ අවසන් කිරීමට ව්‍යාපෘති කටයුතු කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ප්‍රාදේශීය සභාවල එදිනෙදා කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීමට, ක්‍රියාපටිපාටි සරල කිරීමට උපකාර කිරීම සහ පුරවැසියන්ට ප්‍රාදේශීය සභා හිතකර බවට පත් කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදලකින් මූල්‍යායනය වන පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ (ආංශික) ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී ප්‍රාදේශීය සභා සඳහා සකස් කරන ලද පරිගණක මෘදුකාංග විසඳුමක් වන ඊ-පුරනැගුම මෘදුකාංගය පළාත් 07ක තෝරා ගත් ප්‍රාදේශීය සභා 137ක ස්ථාපනය කර තිබුණි. මධ්‍යම හා වයඹ පළාත් දෙකෙහි සිදුකරන ලද විගණනයේදී ප්‍රාදේශීය සභා 41න් ප්‍රාදේශීය සභා 16කම මෙම මෘදුකාංගය භාවිතා නොවන බව ද මෙම මෘදුකාංගය ක්‍රියාත්මක වූ කිසිම පළාත් පාලන ආයතනයක හඳුන්වා දී තිබූ මොඩියුලයන් සඳහා සැලසුම් කළ කාර්යයන් 4න්ම අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී ඇති බව ද නිරීක්ෂණය විය. | අදාළ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් උනන්දුවක් නොදැක්වීම අභ්‍යන්තර හා බාහිර ස්ථාන මාරු, වෙනත් මෘදුකාංග භාවිතය, පුහුණු කාර්යමණ්ඩල ලවා නුපුහුණු නිලධාරීන් පුහුණු නොකිරීම. අමාත්‍යාංශයේ පළාත් පාලන අංශය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය නොවීම | විදේශීය ණය මුදල් භාවිතයෙන් සිදුකරන ව්‍යාපෘති බැවින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 332.19ක වියදමෙන් ඉදිකරන ලදුව ප්‍රාදේශීය සභා 12කට භාරදී තිබූ ජල සම්පාදන ව්‍යාපෘති සහ ප්‍රවේශ මාර්ග මාස 30 සිට මාස 57ක් දක්වා කාලයක් භාවිතයෙන් තොරව නිශ්ක්‍රියව පැවතුණු අතර රු.මිලියන 16.49ක් වැය කර ඉදිකරන ලදුව හෙට්ටිපොළ ප්‍රාදේශීය සභාව වෙත භාර දෙන ලද ආදාහනාගාරයක් මාස 36කට වඩා නිශ්ක්‍රියව පැවතුණි. | සොයා බලා ඉදිරි කටයුතු සිදු කිරීමට පළාත් ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇත. | අපේක්ෂිත ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ අත්පත් කර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශ්වයන් වෙත බලපෑම් කළ යුතුය. |
| (iv) | රු.මිලියන 513.73ක වියදමෙන් ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිලි 12ක් ද, රු.මිලියන 18.90ක වියදමෙන් ඉදිකරන ලද පුස්තකාලයක් ද, රු.මිලියන 105.06ක වියදමෙන් ඉදිකරන ලද සතිපොළ 03ක් ද විවිධ හේතු මත ඌන උපයෝජිතව පැවතුණි. | රත්තොට සතිපොළ කඩකාමර ලෙස වෙන්කර කුලියට දීමට ලංසු කැඳවා ඇති අතර තිස්සමහාරාම මාළු වෙළෙඳපොළ පළතුරු තොග වෙළෙන්දෙකුට කුලියට දී ඇත. වළල්ලාවිට බහුකාර්ය ගොඩනැගිල්ල සම්බන්ධව පළාත් බලධාරීන් සමඟ තවදුරටත් සාකච්ඡා පවත්වන අතර අනෙකුත් ගොඩනැගිලි සම්බන්ධව අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | එම |

| | | |
|---|---|---|
| (v) මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර ප්‍රාදේශීය සභා වෙත භාරදෙන ලද බස්නැවතුම්පොළ, බහුකාර්ය ගොඩනැගිලි, පානීය ජල ව්‍යාපෘති ඇතුළු උපව්‍යාපෘති 16කින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා අවශය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දෙන ලෙස හා නිරන්තරයෙන් පසුවිපරම් සිදුකරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (vi) ව්‍යාපෘතිය මුල් අදියරේදී රු.මිලියන 282.36ක වියදමෙන් ඉදිකරන ලද උඩ පළාත, උඩුදුම්බර හා විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ජල ව්‍යාපෘති 3ක අඩුපාඩු නිවැරදි කිරීම සඳහා පුරනැගුම දෙවන අදියරේදී රු.මිලියන 102ක කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. | අදහස් දක්වා නොමැත. | මුලින් සිදු කරන ලද සැලසුම් නිර්මාණ ආශ්‍රිත ඉදිකිරීම්වල අඩුපාඩු හේතුවෙන් රජයට පාඩුවක් සිදු වී ඇතිනම් අදාළ පාර්ශ්වයන්ට එරෙහිව ක්‍රියාකිරීමට හා පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඉ) නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)** | | |
| ශ්‍රී ලංකා රජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් 2017 ජූලි 17 දින අත්සන් කරන ලද ණය ගිවිසුම අනුව මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් 4ක පානීය ජලය, වාරිමාර්ග, ග්‍රාමීය මාර්ග ආදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ජපන් යෙන් මිලියන 12,957ක ණය මුදලක් ලබා දීමට නියමිත විය. ව්‍යාපෘති කළමනාකරණ කාර්ය සංග්‍රහය අනුව එම සියලු ඉදිකිරීම් 2021 සැප්තැම්බර් වන විට අවසන් කර ව්‍යාපෘතියේ සියලු කටයුතු අවසන් කළ යුතු විය. ව්‍යාපෘති කාර්යසංග්‍රහය අනුව උපව්‍යාපෘති 418ක් අවසන් කළ යුතු වුවත් උප ව්‍යාපෘති 355ක් පමණක් ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන තිබුණු අතර එයින් ද උපව්‍යාපෘති 232ක් කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ සැලසුම් නිර්මාණ හා ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශක සමාගම් දෙකක් පත්කරගෙන ඇති අතර එම සමාගම්වලින් අපේක්ෂිත ප්‍රගතිය අත්කර ගැනීමට අසමත්ව තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය අනුව 2020 වර්ෂය අවසන් වන විට උපයෝජනය කළ යුතු මුදල ජපන් යෙන් මිලියන 8,697ක් වුවත් උපයෝජිත මුදල ජපන් යෙන් මිලියන 643.33ක් වීමෙන්, සියයට 7.39ක ප්‍රගතියක් පමණක් ළඟා කරගෙන ඇති බවත් ඒ අනුව ව්‍යාපෘතිය ඉතා දුර්වල ක්‍රියාකාරී මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය. | මීට පෙර ද දීර්ඝ වශයෙන් විගණනය වෙත කරුණු දක්වන ලද පරිදි මෙම ව්‍යාපෘතියේ උපදේශකවරුන් බඳවා ගැනීම සිදුවූයේ 2019 සැප්තැම්බර් වන අතර, ඊට සමගාමීව ව්‍යාපෘතියේ අනෙකුත් කාර්යයන් ද ප්‍රමාද වූ බැවින් නියමිත කාලය තුළ අපේක්ෂිත ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි විය. කෙසේ වුවද නිරන්තර අධීක්ෂණයෙන් එම ප්‍රමාදය වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. | අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

(ඊ) **උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - අතිරේක ප්‍රතිපාදන (NRCP-AF)**

| | | |
|---|---|---|
| මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ උක්ත ව්‍යාපෘතියේ පළාත් මාර්ග සංරචකය **2020** ජූනි **30** දින වන විට සම්පූර්ණයෙන් ම අවසන්ව පැවතිය ද මෙතෙක් දරන ලද සියලු පොදුකාර්ය වියදම්**,** සුදුසු ක්‍රමයක් පදනම් කරගෙන මාර්ග පිරිවැයට අවශෝෂණය කරමින් ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිසි ක්‍රමවේදය අනුගමනය කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම කඩිනම් කළ යුතුය. |

(උ) **පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (PRDP)**

| | | |
|---|---|---|
| **i.** ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන ආයතනය සමඟ ශ්‍රී ලංකා රජය 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788-**LK** දරන ණය ගිවිසුමෙහි අරමුණ වෙනස්කර ප්‍රතිව්‍යුහගතකරණය කරනු ලැබීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතියේ පළාත් මාර්ග සංරචකය යටතේ පළාත් 9ක ප්‍රාදේශීය මාර්ග ඉදිකිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ඇ.එ.ජ. ඩොලර් මිලියන 109ක ණය මුදලක් ලබා දීමට නියමිත විය. ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය අනුව එම සියලු ඉදිකිරීම් 2023 මාර්තු වන විට අවසන් කළ යුතු විය. ව්‍යාපෘති කාර්යසංග්‍රහය අනුව අදියර 1 යටතේ කි.මී.307ක් වූ මාර්ග 67ක් පැකේජ 18ක් ලෙස 2019 වර්ෂය අවසන් වන විට පිරිනමා අවසන් කළ යුතු වුවත් ඉන් 8ක් පමණක් පිරිනමා තිබුණි. ඉතිරි පැකේජ 10 සමාලෝචිත වර්ෂයේදී පිරිනමා තිබුණි. කෙසේ වෙතත් වර්ෂය තුළ පැකේජ 6ක කිසිදු ප්‍රගතියක් අත්කර ගැනීමට අසමත්ව තිබුණි. | පළාත් මාර්ග සංරචකය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ඇ.ඩො.මි.109 ක් ලැබුණු අතර, එය 2023 මාර්තු වන විට අවසන් කළ යුතුව ඇත. එහි අදියර 1 යටතේ මාර්ග පැකේජ 18 ද අදියර 2 යටතේ තවත් පැකේජ 27 ද වශයෙන් සැලසුම් කළ ද ඒවායේ කොන්ත්‍රාත් මිල අනුව සම්පූර්ණ පැකේජ 27 කට සීමා කිරීමට සිදුවිය. එම 27හි ප්‍රසම්පාදන කටයුතු 2020 දෙසැම්බර් වන විට අවසන් කිරීමට සැලසුම් කර පුවත්පත් දැන්වීම් ද පළ කරන ලදී. කොන්ත්‍රාත් මිල ගණන්වල පැවති ඉහළ අගයන් නිසා හා සමහර පැකේජ සඳහා මිල ගනන් ඉදිරිපත් නොවූ බැවින් නැවත මිල කැඳවීමට සිදුවිය. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු නියමිත පරිදි ආරම්භ කර ඇත. | නියමිත කාලය තුළ ව්‍යාපෘතියේ නියමිත කාර්යසාධන මට්ටම පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **ii.** සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 7,769.86ක පිරිවැයකින් යුත් කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා සංවර්ධනය කළ යුතු මාර්ග හඳුනාගෙන විස්තරාත්මක ව්‍යාපෘති වාර්තා සකස් කළ යුතු වුවත් වර්ෂය තුළ ඒ පිළිබඳ කිසිදු ප්‍රගතියක් අත්කරගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | අදහස් දක්වා නොමැත. | ප්‍රමාණවත් කාර්යසාධනයක් අත්පත් කරගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **iii.** 2019 හා 2020 වර්ෂවල වාර්ෂික ඇස්තමේන්තු අනුව 2020 වර්ෂය අවසන් වන විට උපයෝජනය කළ යුතු මුදල රු.මිලියන 1,831.63ක් වුව ද උපයෝජනය කර ඇති සම්පූර්ණ මුදල රු.මිලියන 635.47ක් හෙවත් | 2019 – 2020 අතර කාලය සඳහා රු.මිලියන 4,500ට ආසන්නව වියදම් කිරීමට සැලසුම් කළ ද කොවිඩ් වසංගත තත්ත්වය හා අතුරු සම්මත | එම |

| | | | |
|---|---|---|---|
| | සියයට 34.69ක් වීමෙන් මූල්‍ය ප්‍රගතිය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | ගිණුම් යටතේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණු හෙයින් වියදම් පාලනය කිරීමට සිදුවිය. ඒ අනුව 2020 වර්ෂය අවසානය වනවිට රු.මි.1800 ක් වියදම් කිරීමට සැලසුම් කළ ද රු.මි.958ක ප්‍රතිපාදන පමණක් වෙන් විය. ඒ අනුව කොන්ත්‍රාත් ගෙවීම් වශයෙන් රු.මි.637ක් හා ඉතිරිය අත්තිකාරම් ගෙවීම් වශයෙන් මුළු ප්‍රතිපාදනය ම වැය කර ඇත. | |
| **iv.** | මෙම ව්‍යාපෘතිය සඳහා විනිවිදභාවයකින් තොරව සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් තනිපුද්ගල උපදේශකවරුන් 15 දෙනෙකු කාල පදනමට ගෙවීම සඳහා බඳවාගෙන තිබුණු අතර ඔවුන්ගෙන් ප්‍රමාණවත් සේවයක් ලබාගැනීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය මාර්ග සංවර්ධන අමාත්‍යාංශයෙන් මෙම අමාත්‍යාංශයට ලැබුණු ව්‍යාපෘතියක් වන අතර**,** මෙහි වෙනත් ව්‍යාපෘතිවල මෙන් උපදේශක සමාගම් හෝ කලින් සැලසුම් කළ ව්‍යාපෘති රාමුවක් නොවීය.<br>විගණන වාර්තාවේ සඳහන් පරිදි මෙහි සැලසුම් නිර්මාණය කිරීමට කිසිදු උපදේශකයකු බඳවා ගෙන නොමැත. ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශකවරුන් බඳවාගෙන ඇති අතර ඔවුන්ගේ මැදිහත්වීම තුළ සැලසුම් නිර්මාණයට ද කටයුතු කර ඇත. ඒ අනුව ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යයට අමතර සේවයක් ලබා ගෙන ඇත. | එම |
| **(ඌ)** | **මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - ණය ගිවිසුම් අංක 2557/2558** | | |
| i. | මෙම ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 04 දින ආරම්භ කර 2015 ජූනි 30 දින අවසන් කිරීමට තිබූ නමුත් ව්‍යාපෘතිය අවසන් වීමේ දිනය 2021 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 4කදී මාස 78ක් දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේ සිට පැවති කොන්ත්‍රාත් කළමනාකරණයේ අඩුපාඩු, ව්‍යාපෘති සංරචකයන් සඳහා පිරිවැය වෙන්කිරීමේ අඩුපාඩු, ශක්‍යතා අධ්‍යයන අඩුපාඩු, පාරිසරික තක්සේරුවල දුර්වලතාව, ඉඩම් අත්පත් කරගැනීමේ ගැටළු, නැවත පදිංචිකරවීමේ ක්‍රියාවලියේ දුර්වලතාවන් යනාදී කරුණු හේතුවෙන් මන්දගාමීව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් බවට පත් වී ඇත. | ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය විවිධ හේතු මත දීර්ඝ කිරීමට සිදු වූ අතර, කොන්ත්‍රාත් පිරිනැමීමේ ප්‍රමාදය හා කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩ කරගෙන යාමේදී සිදු වූ ප්‍රමාදය මේ සඳහා මූලික විය. | ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| **ii.** 2020 දෙසැම්බර් 31 දින වන විට උපදේශන සේවා ගාස්තු සඳහා ගෙවා ඇති මුදල රු.1,066,143,753ක් විය. ණය ගිවිසුම අනුව උපදේශන කටයුතු සඳහා වෙන් කර ඇති මුදල රු.935,870,000ක් වූ බැවින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.130,273,753ක් වැඩිපුර ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් පිරිනැමීමේදී සිදු වූ ප්‍රමාදයන් සහ රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය වැඩිවීම මේ සඳහා හේතු වී ඇත. | ව්‍යාපෘතිය මනා ලෙස සැලසුම් කිරීම, කළමනාකරණය සහ විධිමත් අධීක්ෂණයක් තුළින් මෙවැනි වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **iii.** 2020 වර්ෂයේදී ප්‍රතිපත්ති සහායක කණ්ඩායම් රැස්වීම් 2ක් පමණක් පවත්වා තිබුණු නමුත් නිලධාරීන් 7 දෙනෙකු සඳහා මසකට එක් අයෙකුට රු.60,000 බැගින් රු.5,096,000ක් සහ ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.38,730,786ක් ගෙවා තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය අවසන් කළ යුතු දිනය ඉක්මවා මාස 66ක් ගත වී ඇති අතර ව්‍යාපෘතියේ කාර්යසාධනය සඳහා ප්‍රතිපත්ති සහායක කණ්ඩායම් මගින් ඵලදායී දායකත්වයක් ලබා දී ඇති බවක් නිරීක්ෂණය නොවිය. | මෙම නිලධාරීන් තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ව්‍යාපෘතිය වෙනුවෙන් කටයුතු කරන බව දන්වා ඇත. | ප්‍රතිපත්ති සහායක කණ්ඩායම් සක්‍රීය ලෙස ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීම සඳහා දායකත්වය දැක්විය යුතු අතර ඔවුන්ගේ කාර්යසාධනය කොපමණ ද යන්න පරීක්ෂා කළ හැකි විය යුතුය. |
| **(එ) මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - ණය ගිවිසුම් අංක 3030** | | |
| **CCTV** තාක්ෂණය භාවිතයෙන් අපජල නාලිකා පිරිසිදු කිරීමේ සමීක්ෂණය, තත්ත්ව පරීක්ෂාව සහ කි.මී. 108ක අපජල නාලිකා පිළිබඳ දත්ත පද්ධතියක් පිළියෙල කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තු ක්‍රියාවලිය 2016 වර්ෂයේදී ආරම්භ කර තිබූ නමුත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර නොතිබුණි. | විවිධ හේතු මත කොන්ත්‍රාත්තුව පිරිනැමීම ප්‍රමාද වී ඇති බව පිළිගනී. | කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම තුළින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඒ) මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - ණය ගිවිසුම් අංක 3348/3349** | | |
| **i.** කිරුළපන මලාපවාහන ජාලය හා පොම්පාගාර දෙකක් ඉදිකිරීම සඳහා 2017 මැයි 04 දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබූ අතර 2020 මැයි 04 දින කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතුව පැවතුණි. මෙම ඉදිකිරීම සඳහා අවශ්‍ය එක් ඉඩමක් වසර 3ක කාල ප්‍රමාදයකින් පසුව 2020 ජූනි 08 දින කොන්ත්‍රාත්කරු වෙත භාර දී තිබුණි. එමෙන්ම වැඩ බිම් නොමැති වීම හේතුවෙන් සිදු වූ ප්‍රමාදය ආවරණය කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු.257,171,849ක හිමිකම් පෑමක් සිදුකර තිබුණි. | ඉඩම් ලබා දීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වී ඇති අතර කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ ප්‍රමාදයක් පවතී. කොන්ත්‍රාත්කරු කාල ප්‍රමාදය සඳහා කරන ලද හිමිකම් පෑම මේ දක්වා ගෙවා නොමැත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කොන්ත්‍රාත් ප්‍රමාදයන් සහ අමතර පිරිවැය ඇති වීම වැළැක්වීම සඳහා නිසි නියාමන හා සුපරීක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **ii.** | වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 වර්ෂයේ දෙවන කාර්තුව තුළ ප්‍රදානය කර 2021 පෙබරවාරි 04 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබූ නමුත් වසර 3½ක පමණ කාල ප්‍රමාදයකින් පසු 2020 දෙසැම්බර් 18 දින වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | ලංසු ලියවිලිවල ගැටළු සහ කොවිඩ් තත්ත්වය හේතුවෙන් ප්‍රමාද විය. | ප්‍රමාදවීම්වලින් තොරව කොන්ත්‍රාත්තු ප්‍රදානය සහ ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ජනතාවට නියමිත කාල සීමාවන් තුළ ලබාදීමට පියවර ගත යුතුය. |
| **iii.** | කිරුළ-නාරාහේන්පිට ප්‍රදේශය වෙත මලාපවාහන පහසුකම් සැපයීමේ කොන්ත්‍රාත්තුව 2018 වන විට අවසන් විය යුතු වුවත් කොන්ත්‍රාත්තු ප්‍රදානය 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ඉඩම් සොයා ගැනීමේ අපහසුතාව මත කොන්ත්‍රාත්තුව ප්‍රමාද විය. | කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම තුළින් ව්‍යාපෘති කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඔ) ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය**

| | | | |
|---|---|---|---|
| **i.** | එක්සත් රාජධානිය, නෙදර්ලන්තය ආදී රටවල පෞද්ගලික බැංකුවලින් එකී රටවල අපනයන සංවර්ධනය කිරීමේ ණය ලෙස ලබා දී ඇති ණය මුදල් භාවිතයෙන් ඉදිකෙරෙන පාලම් සඳහා ස්ථාන තෝරා ගැනීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් නොපැවති අතර ව්‍යාපෘති කාර්යමණ්ඩලයක් පැවතිය ද ඒකාබද්ධිත විශාල ප්‍රමාණයේ කොන්ත්‍රාත් **(Turn Key)** ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණි. | නව පාලම් සඳහා ස්ථාන තෝරාගැනීමේ ක්‍රමවේදය නැවත වරක් අධ්‍යයනය කරන ලදී. එම ක්‍රමවේදය තුළ නව පාලම් ඉදිකිරීම සඳහා ඵලදායි ස්ථාන හඳුනා ගැනීමට පාදක කරගත යුතු නිර්නායක ද ඒ මත පදනම්ව ඵලදායි ස්ථාන තෝරා ගැනීම සඳහා යොදා ගන්නා ශක්‍යතා අධ්‍යයන ක්‍රියාමාර්ගයක් ද අන්තර්ගත බව අධ්‍යයනයේදී අනාවරණය විය. මෙම ක්‍රමවේදය තුළින් ඍජු ආර්ථික ප්‍රතිලාභ හෝ ඍජු සමාජයීය ප්‍රතිලාභ ලැබෙන අයුරින් පාලම් ඉදි කළ යුතු ස්ථාන වෙන්කර හඳුනා ගැනීමට ඉඩ සැලසී තිබේ. ඒ අනුව එම ක්‍රමවේදයේ අඩුපාඩු නොමැති බව තහවුරු කරමි. | පැහැදිලි කිරීම ක්‍රියාවට නැංවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **ii.** | ගිවිසුම අනුව පාලම් සවිකළ යුතු ස්ථාන හඳුනාගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් දියත් කර නොතිබුණු අතර පාලම් ස්ථානගත කළ යුතු ස්ථාන තීරණය කිරීමේදී පාලමක් සඳහා වන පිරිවැය හා එම පාලමෙන් ප්‍රයෝජන ගනු ලබන්නන් සංඛ්‍යාව හා අනාගතයේදී සිදුවිය හැකි වර්ධනයන් සලකා ප්‍රමාණවත් පිරිවැය ප්‍රතිලාභ විග්‍රහයකින් පසුව ස්ථාන තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම වසර 100කට වැඩි කාලයක පැවැත්මක් අපේක්ෂාවෙන් සවිකරනු ලැබුව ද පාලමේ කොන්ක්‍රීට් ඉදිකිරීම පිළිබඳ කිසිදු ප්‍රමිති පාලන කටයුත්තක් සිදු කර නොතිබුණි. | ඉහත (i) හි සඳහන් කළ පරිදි නව පාලම් ස්ථාන තෝරා ගැනීමේ නිර්ණායක හා ශක්‍යතා අධ්‍යයන අනුසාරයෙන් මූලික පියවර ලෙස ඒකාබද්ධ ස්ථාන පරීක්ෂණයක් තුළින් ස්ථානීය ශක්‍යතාවය අධ්‍යයනයට ලක් කරනු ලබයි. මේ සඳහා වූ ඒකාබද්ධ කණ්ඩායමේ සාමාජිකයන් ලෙස පළාත් ව්‍යාපෘති ඉංජිනේරුවරයා ද, කොන්ත්‍රාත් නියෝජිත ආයතනයේ ඉංජිනේරුවරයා ද, ප්‍රජා මූලිකයෙකු හෝ ස්ථානය යෝජනා කළ පාර්ශවය සහභාගි වේ. එහිදී ලබාගන්නා නිරීක්ෂණ අනුව එම ස්ථානය නව පාලමක් ඉදිකිරීම සඳහා සුදුසු ද/නුසුදුසු ද යන්න මූලිකව නිර්ණය කරනු ලැබේ.<br><br>මූලිකව ඒකාබද්ධ කණ්ඩායම විසින් නිර්දේශ කරන්නේ නම් දෙවන පියවර ලෙස පළාත් ප්‍රධාන ලේකම් මඟින් අදාළ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ද ඉදිරිපත් කර ස්ථානය අනුමත වන්නේ නම් පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය සමග මෙම අමාත්‍යාංශය වෙත යොමුකරනු ලැබේ.<br>අමාත්‍යාංශය වෙත ලැබුණු පසු එම ස්ථානවලට සරිලන පිරිවිතරයන් ගෙන් සමන්විත වන පාලම් තිබේ දැයි තහවුරු කර ගැනීම ඊළඟ පියවර වේ. එලෙස තහවුරු කර ගන්නා ලද පාලම් ස්ථාන මෙම අමාත්‍යාංශයේ අනුමැතියට ද යටත් වන අතර, එය පාලම් ස්ථාන තේරීමේ උපරිම හා අවසානාත්මක පියවර වේ. මෙම අමාත්‍යාංශයේ අනුමැතියලත් පාලම් ස්ථාන කොන්ත්‍රාත් සමාගම වෙත ප්‍රදානය කරනු ලැබේ. | කොන්ක්‍රීට් ඉදිකිරීම් පිළිබඳ තත්ත්ව පරීක්ෂණ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| **iii.** වානේ පාලමක අවශ්‍යතාවයක් නොමැතිව ආයෝජනය කරන ලද මුදලට සාපේක්ෂව ප්‍රතිලාභයක් හිමි නොවන මෙන් ම බෝක්කු ඉදි කළ යුතු ස්ථානවල විශාල ප්‍රමාණයේ පාලම් ඉදිකර ඇති අවස්ථා නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. | වර්ෂය පුරා ජලය ගලා බසිනා ඇළ දොළ මාර්ග පිහිටා ඇත්තේ දිවයිනේ තෙත් කලාපීය ප්‍රදේශවල පමණි. අනෙකුත් ප්‍රදේශවල ඇති ඇළ දොළ මාර්ග විශේෂයෙන්ම මෝසම් කාලවලදී පමණක් සක්‍රිය වන අතර, එම කාලවලදී ඒවා හරහා එගොඩ මෙගොඩ වීම සඳහා එම ප්‍රදේශවල ජනතාවට එම ස්ථානවල පාලමක් නොමැතිවීම කරුණු කොට ගෙන බොහෝ පීඩාවලට ලක් වීමට සිදු වේ. එබැවින් වර්ෂය පුරාවටම ජලය ගලා නොයන දිවයිනේ අතර මැදි කලාප හෝ වියළි කලාපවල පිහිටි ඇළ දොළ මාර්ග හරහා ද මෙම ව්‍යාපෘතිය යටතේ පාලම් ඉදිකිරීමට කටයුතු කර ඇත.<br><br>තව ද, පාලමක් ඉදිකළ යුතු වුව ද ඇතැම් ස්ථානවල විවිධ හේතූන් නිසා පාලමක් වෙනුවට කුඩා බෝක්කු හෝ කුඩා පාලම් ඉදිකර තිබිය හැකිය. විශාල පාලමක් ඉදිකළ යුතු ස්ථානවල ඉදිකර ඇති ප්‍රමාණවත් නොවන බෝක්කු හෝ කුඩා පාලම් ඉවත් කර ඒ වෙනුවට නියමිත දිගින් යුතු පාලම් මෙම ව්‍යාපෘතිය යටතේ එවැනි ස්ථානවල ඉදිකිරීමට කටයුතු කර ඇත. | ආයෝජනය කරනු ලබන මුදලට සාපේක්ෂව ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ පිළිබඳ අධ්‍යයනය කර අවශ්‍යතාව මත ස්ථාන තෝරාගත යුතු වීම. |

## 3.8 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මණ්ඩලය විසින් වත්කම් කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයක් සපයා ගැනීම සම්බන්ධයෙන් වන කොන්ත්‍රාත්තුව පිළිබඳ දැන්වීම ආසියානු සංවර්ධන බැංකු වෙබ් අඩවියේ පළ කිරීමටත්, මෙම කොන්ත්‍රාත්තුව සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගැනීමේ බලය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත පැවරීමටත්, ගුණාත්මකභාවය හා පිරිවැය පදනම (CQS) මත කොන්ත්‍රාත්තුව පැවරීමටත් තීරණය කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10 ඡේදය අනුව හා ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.8 ඡේදයේ උපදෙස් අනුව ජාතික පුවත්පත්වල ප්‍රසම්පාදන දැන්වීම ප්‍රසිද්ධ නොකිරීම හේතුවෙන් කිසිදු දේශීය ලංසුකරුවෙකු ඉදිරිපත් වී නොතිබුණි. | මෙම උපදේශක ආයතනය පත්කිරීම ආසියානු සංවර්ධන බැංකු ප්‍රසම්පාදන නීති රීති යටතේ සිදුකර ඇත. මෙය විදේශාධාර ව්‍යාපෘතියක් වන බැවින් ණය දෙන ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වේ. ඒ අනුව කිසිදු විටෙක ක්‍රියාවලියෙන් බැහැරව ගොස් නැත. | රජයේ ප්‍රසම්පාදන සංග්‍රහයේ විධිවිධාන මෙන්ම ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන උපදෙස්වලට ද අනුකූලව ප්‍රසම්පාදනයන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 නොවැම්බර් 14 දින රැස් වූ ප්‍රසම්පාදන මණ්ඩලය ඇමෙරිකානු ඩොලර් 179,983.50 (රු.මිලියන 32.30)කට ඕස්ට්‍රේලියානු සමාගමකට මෙම කොන්ත්‍රාත්තුව ලබාදීමට තීරණය කර තිබුණි. ආයතනයකට පරිගණක මෘදුකාංගයක් (තොරතුරු තාක්ෂණ විසඳුමක්) හඳුන්වාදීමේදී එම මෘදුකාංගය සංවර්ධන කිරීම, ස්ථාපිත කිරීම, පුහුණු කිරීම මෙන් ම සහාය හා නඩත්තු සේවය ලබා ගැනීම අත්‍යවශ්‍ය වුවත් මෙම කොන්ත්‍රාත්තුවේදී සහාය හා නඩත්තු සේවය පිළිබඳ සලකා බලා නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව අනුව මෘදුකාංගයක් නිර්මාණය කිරීම, ස්ථාපනය කිරීම හා පුහුණුව ඔවුන්ට පවරා ඇත. නඩත්තුව පිළිබඳව කොන්ත්‍රාත්තුවට ඇතුළත් කර නොමැත්තේ කාලය හා අමතර මුදල සලකා බලා ය. එහෙත් ක්‍රියාත්මක කිරීමෙන් පසු යම් ගැටළුවක් වෙතොත් ඒ සඳහා සහායවීමට ඔවුන් එකඟ වී ඇත. | ආයෝජනය කරනු ලබන මුදලෙන් උපරිම ප්‍රතිලාභයක් ලැබෙන ලෙස කටයුතු කළ යුතුය. |
| (ඇ) | මෘදුකාංගය සංවර්ධන කිරීම, ස්ථාපිත කිරීම, පුහුණු කිරීම ආදී කාර්යයන් සඳහා ගුණාත්මකභාවය හා පිරිවැය පදනමට උපදේශක ආයතනයක් තෝරා ගැනීම ප්‍රශ්නසහගත බව නිරීක්ෂණය විය. | ආසියානු සංවර්ධන බැංකු ප්‍රසම්පාදන කාර්යසංග්‍රහය අනුව මෙවැනි කර්තව්‍යයන් සඳහා ඉතාම සුදුසු වන්නේ CQS ක්‍රමවේදයයි. තව ද මෙම ක්‍රමවේදය අනුගමනය කිරීමට අමාත්‍යාංශය ආසියානු සංවර්ධන බැංකුවෙන් ඉල්ලා නොසිටි අතර මෙය අනුගමනය කරන ලෙස උපදෙස් ලබා දුන්නේ ආසියානු සංවර්ධන බැංකුවයි. | විගණනයට පිළිතුරු ලබාදීමේදී නිශ්චිත සාක්ෂි සමඟ පිළිතුරු ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඈ) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් 2012 වර්ෂයේ සිට පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක කරමින් පවතින පරිගණක පද්ධතියේ 2018 වර්ෂයට අදාළ ආධාරක හා නඩත්තු සේවා ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගිවිසුමක් අත්සන් තබා ඇති අතර එම පද්ධතියේ II අදියරේදී වත්කම් කළමනාකරණ වැඩසටහන ඇතුළත්ව තිබියදී ප්‍රාදේශීය සභා 07ක මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට උපදේශක සමාගමක් ලෙස කොන්ත්‍රාත්කරුවෙකු පත් කර ගැනීමට ක්‍රියාකර තිබුණි. | පළාත් පාලන පද්ධතිය සඳහා පිළියෙළ කරන ලද ගිවිසුම අනුව වත්කම් කළමනාකරණ විෂයය ආවරණය නොවේ. | තොරතුරු අධ්‍යයනය කර විධිමත්ව ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | 2011 වර්ෂයේ ආරම්භ කළ පුරනැගුම ව්‍යාපෘතිය 2020 ජුනි මාසයේදී අවසන් වීමට නියමිතව තිබියදී ව්‍යාපෘතිය ආරම්භක කාලයේ ක්‍රියාත්මක කළ යුතුව තිබූ නියමු ව්‍යාපෘතියක් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. | 2012 වර්ෂයේ සිට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ආසියානු සංවර්ධන බැංකුව විසින් පත්කළ උපදේශක සමාගම සමඟ අමාත්‍යාංශය මෙම විෂයය සම්බන්ධයෙන් කටයුතු කර ඇතත් සාර්ථක | නිෂ්කාර්ය වියදමක් නොවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කවරේ ද යන්න පැහැදිලිව දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෘදුකාංගයක් වත්කම් කළමනාකරණය සඳහා නිර්මාණය කිරීමට නොහැකිවී ඇත. එහෙත් වරිපනම්, ගිණුම් ආදී අනෙකුත් ක්ෂේත්‍ර පරිගණක මෘදුකාංගය මඟින් මේ වන විට ආවරණය කර ඇත. ව්‍යාපෘති කාල සීමාව තුළ, නියමු ව්‍යාපෘතියක් ලෙස ප්‍රාදේශීය සභා 07ක මෙම වත්කම් කළමනාකරණ මෘදුකාංගය ද නිම කළ පසු අනෙකුත් ප්‍රාදේශීය සභා සඳහා මෙම මෘදුකාංගය ස්ථාපනය කිරීම අමාත්‍යාංශය මඟින් සිදුකළ හැකිවේ. ව්‍යාපෘතිවලින් සිදුකරන සියලු කටයුතු අවසානයේ හා ඒවා අමාත්‍යාංශයේ විෂය පථය තුළ ක්‍රියාත්මක වන බැවින් මෙය ද අමාත්‍යාංශයේ කාර්යභාරයට ඇතුළත් වේ. | |
| **(ඊ)** | මෙම මෘදුකාංගය ස්ථාපිත කිරීම තවදුරටත් කරගෙන යන්නේ ද නැද්ද පිළිබඳ තීරණයක් ගැනීම සඳහා අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන), ප්‍රධාන මූල්‍ය නිලධාරි, නීති නිලධාරි, ව්‍යාපෘති අධ්‍යක්ෂ යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර 2020 දෙසැම්බර් 16 දිනට පෙර කමිටු වාර්තාව ලබාදෙන ලෙස නියමකර තිබුණ ද 2021 අගෝස්තු 31 දින වන විට ද එම කමිටු තීරණය ලබා දී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | තොරතුරු අධ්‍යයනය කර විධිමත් පරිදි කටයුතු කළ යුතුය. |
| **(උ)** | විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ප්‍රසම්පාදන තීරණයක් ගෙන මුදල් රෙගුලාසි 137 (1), (2), (3), (4) හා 138හි විධිවිධාන පිළිබඳ සැලකිල්ලක් නොදක්වා "ඊ-පළාත් පාලනය" පරිගණක පද්ධතියේ සහායක හා නඩත්තු සේවා සඳහා පුද්ගලික සමාගමකට 2018 වර්ෂයේදී රු.මිලියන 9.6ක් ගෙවා තිබුණු අතර 2019 වර්ෂය ආරම්භ වන විටත් අකර්මණ්‍ය වී තිබූ ඊ පළාත් පාලනය පරිගණක පද්ධතියේ සහායක හා නඩත්තු සේවාවන් සපයා නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ලබාදී ඇති නිර්දේශ හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන අදාළ ගෙවීම් සිදුකර ඇත. | වියදම් අනුමත කිරීමේදී හා සහතික කිරීමේදී විධිමත් පරිදි ක්‍රියා කිරීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2018 මාර්තු 08 දින ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශයේ පළාත් පාලන ආයතන 30ක ක්‍රියාත්මක කළ ඊ-පළාත් පාලන පද්ධතිය ක්‍රියාත්මක වන බව සඳහන් වන අතර ඒ අනුව **"2017 සහ 2018 වර්ෂ සඳහා ඊ-පළාත් පාලන පද්ධතියට සහාය හා නඩත්තු සේවා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ M/S hsenid Business Solution පුද්ගලික සමාගම වෙතින් ලබා ගැනීම යෝජනා කරමු"** යනුවෙන් සඳහන් වේ. මෙම කැබිනට් සංදේශයට 2018 මාර්තු 27 දින අංක අමප/18/0512/744/003-1 හා 2018 අප්‍රේල් 24 දිනැති කැබිනට් තීරණයෙන් අනුමැතිය ලැබී තිබුණි.<br><br>එසේ වුව ද කැබිනට් සංදේශය මගින් කැබිනට් මණ්ඩලය වෙත පහත සඳහන් පරිදි නිවැරදි නොවන තොරතුරු සපයා තිබුණි.<br><br>- 2018 මාර්තු 08 දින වන විට පළාත් පාලන ආයතන 30ක මෙම පද්ධතිය ක්‍රියාත්මක වන බව සඳහන් කිරීම.<br>- පළමු අදියර යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් බලපත්‍රය ලබාදීම හා සියලු නිත්‍ය ආදායම් රැස්කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන බව සඳහන් කිරීම.<br>- 2018 ජුනි මාසයේ තවත් පළාත් පාලන ආයතන 50ක මෙම තොරතුරු පද්ධතිය හඳුන්වා දීමට සැළසුම් කර ඇති බව සඳහන් කිරීම. | අදහස් දක්වා නොමැත. | විධිමත් පරීක්ෂණයක් තුළින් අඩුපාඩු හා වගකිව යුතු පුද්ගලයින් හඳුනාගෙන ඉදිරි කටයුතු කිරීම යෝග්‍ය වේ. |

## 3.9 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගරු අමාත්‍යවරයා හා ඔහුගේ පෞද්ගලික කාර්යමණ්ඩලය සඳහා වෙන් කළ, අමාත්‍යාංශය සතු වාහන 07ක් විධිමත් ක්‍රියාපටිපාටියකින් තොරව ආරක්ෂක අමාත්‍යාංශය වෙත රැගෙන ගොස් තිබුණු අතර මේ වන විටත් මෙම වාහන පවරා දීමට හෝ ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිටපු පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු සරත් වීරසේකර මහතා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ කැබිනට් අමාත්‍යවරයා වශයෙන් 2020 ඔක්තෝබර් 29 දින එම අමාත්‍යාංශයේ වැඩ භාර ගත් අතර, ඒ වනවිට ඒ මහතා සහ කාර්යමණ්ඩලය වෙත මෙම අමාත්‍යාශයට අයත් වාහන 8 ක් සේවයේ යොදවා තිබුණි. එයින් අංක KR 8778 දරන වාහනය හා V8 ජීප් රථය 2020 මාර්තු 25 දින මෙම අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී. සෙසු වාහන 07 මෙම අමාත්‍යාංශයට ලබා දෙන ලෙස අවස්ථා කිහිපයක දීම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපි මඟින් දැනුම් දී ඇත. එමෙන්ම කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ද මේ සම්බන්ධයෙන් වාර්තා කර ඇත. | ආපසු ලබා ගැනීම හෝ පවරා දීම සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කෙසේ වෙතත් මෙම අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යවරයාට හා කාර්යමණ්ඩලයට ලබාදීමට ප්‍රමාණවත් සුදුසු වාහන අමාත්‍යාංශය සතුව නොමැති නිසා, ඉහත වාහන මහජන ආරක්ෂක අමාත්‍යාංශයට පවරා දීමට හැකියාවක් නොමැති බැවින්, එම වාහන ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් පසු විපරම් කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | |

**(ආ) බදු කුලී පදනම මත වාහන ලබා ගැනීම**

| | | |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක BD/GPS/155/08/03 හා 2019 මාර්තු 13 දිනැති ලිපියෙන් නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) සඳහා ලංකා බැංකුවේ මූල්‍ය කල්බදු පහසුකම් යටතේ කැබ් රථ 10ක් මිලදී ගැනීම අනුමත කර තිබුණු අතර කල්බදු පොලිය වැය විෂයය 1406 යටතේ ගෙවීම් කිරීමටත් ප්‍රාග්ධන වාරිකය වැය විෂයය 2108 යටතේ ගෙවීම් කිරීමටත් උපදෙස් දී තිබුණ ද අදාළ වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන හා කල්බදු පොලී වාරිකය ලෙස පිළිවෙලින් රු.15,493,129ක් හා රු.9,890,231ක් ද වූ අතර එම මුදල නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම් සඳහා වූ ප්‍රතිපාදන භාවිතයෙන් එම ව්‍යාපෘතිය විසින් ගෙවීම් සිදු කර තිබුණි. | නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කල්බදු ක්‍රමය යටතේ කැබ්රථ 10 ක් මිලදී ගැනීමේ කල්බදු පොළිය සහ ප්‍රාග්ධන වාරිකය ගිණුම් ගත කිරීම සඳහා පිළිවෙළින් 420-2-03-012-1406 සහ 420-2-03-012-2108 යන වැය විෂයයන් යටතේ 2021 වාර්ෂික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්කර දී ඇත. | කල්බදු පොලිය හා ප්‍රාග්ධන වාරික නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 3.10 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේදී රු.මිලියන 935.69ක වියදමෙන් මිලදී ගත් කවශිමා යන්ත්‍ර 9න් කාත්තන්කුඩි නගර සභාවේ සවිකිරීමට නියමිතව තිබූ යන්ත්‍රයට ගිනි හානියක් සිදුව ඇති බව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ ප්‍රගති වාර්තාවකින් හෙළිදරව් කර තිබුණි. මෙම යන්ත්‍රය වෙනුවෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ යන්ත්‍රය ස්ථාපිත කර ඇති අතර ඊට අදාළ යාන්ත්‍රික, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික කොටස් මුලින් රඳවා තිබූ ස්ථානයෙන් ඉවත් කර අබලි ද්‍රව්‍ය ගබඩාවක තැන්පත් කර ඇත. 2020 ජූලි 24 දිනැති ආණ්ඩුවේ රස පරීක්ෂක වාර්තාවේ හා 2020 ජූනි 09 දිනැති ආණ්ඩුවේ ජාතික ඝණ අපද්‍රව්‍ය හා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකගේ නිරීක්ෂණ වාර්තාවේ දැක්වෙන පරිදි මෙම ගබඩා සංකීර්ණය අසල නොදිරන කසළ ද නිරන්තරයෙන් ගිනි තබනු ලබන අතර එම ගින්න ගබඩා සංකිර්ණය වෙත ද පැතිරී ඇත. ජාතික ඝණ අපද්‍රව්‍ය හා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් යන්ත්‍රයට සිදු වී ඇති අලාභය රු.මි.30ක් වශයෙන් තක්සේරු කර, නගර සභාවෙන් අයකර ගත යුතු බව නිර්දේශ කර තිබුණ ද විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකීම නිශ්චය කිරීම හා අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාත්තන්කුඩි නගර සභාවේ සවි කිරීමට නියමිත වූ කවශිමා යන්ත්‍රවල ගින්නෙන් පිළිස්සුණු කොටස් මේ වන විට ජපානයෙන් ආනයනය කර ඇති අතර, එය යථාවත් කිරීමට කටයුතු කර ඇත. හානිය සම්බන්ධවූ ඉදිරි කටයුතු ද කෙරෙමින් පවතී. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුත්තන් හඳුනාගැනීමට හා අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අංක WP PF-7336 දරන වාහනය 2020 අගෝස්තු 31 දින අනතුරකට ලක් වී තිබියදී ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදු නොකර ආරක්ෂක අමාත්‍යාංශයට රැගෙන යාමට ඉඩ හැර තිබුණි. | WP PF-7336 අංක දරන වාහනය 2020 අගෝස්තු 31 දින අනතුරකට ලක්වුව ද, ඒ හේතුවෙන් වාහනය ධාවනය කළ නොහැකි මට්ටමක නොපැවතුණි. මෙම වාහනය හිටපු රාජ්‍ය අමාත්‍යතුමා ගේ මාධ්‍ය ලේකම් විසින් භාවිතා කරමින් සිටි බැවින් එය නව අමාත්‍යාංශය වෙත රැගෙන ගොස් ඇත. තව ද ඉහත වාහනය ගරාජයකට පෙන්වා ඇස්තමේන්තු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස වාහනය භාර නිලධාරියාට දැනුම් දී ඇතත්, පැවති තත්ත්වය හේතුවෙන් එකී කාලය තුළ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි වී ඇත. කෙසේ වුව ද මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | වාහන අනතුර සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව ඉදිරි කටයුතු සිදුකළ යුතුය. |

## 4. යහපාලනය

-------------

### 4.1 අභ්‍යන්තර විගණනය

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම අමාත්‍යාංශය යටතේ විදේශාධාර ව්‍යාපෘති 12ක් ක්‍රියාත්මක කෙරෙන අතර ඒ සඳහා වෙන් වෙන් වශයෙන් ව්‍යාපෘති කාර්යාල හා කාර්යමණ්ඩල පවත්වාගෙන ගිය ද එම ව්‍යාපෘතිවල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කළ යුතුය. |

### 4.2 විගණන කළමනාකරණ කමිටුව

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශ ණය උපයෝජිත සංවර්ධන ව්‍යාපෘතිවල ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් එම ව්‍යාපෘතිය සම්බන්ධව ගණන්දීමේ නිලධාරීන් ලෙස කටයුතු කළ ද එම ව්‍යාපෘති 12 අතුරින් ව්‍යාපෘති දෙකක හැර අනෙකුත් ව්‍යාපෘති 10 සඳහා විගණන කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | විගණන කළමනාකරණ කමිටු පැවැත්විය යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය විසින් අංක 25/2014 හා 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ද්විතියික මට්ටමට ඇතුළත් වන කළමනාකරණ සේවා නිලධාරීන් 31 දෙනෙකු හා ප්‍රාථමික මට්ටමේ 29 දෙනෙකු අමාත්‍යාංශයට බඳවාගෙන තිබුණි. එම නිලධාරීන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා තිබුණු අතර මේ දක්වා එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි. කළමනාකරණ සේවා නිලධාරීන් 31 දෙනාගෙන් 13 දෙනෙකු ව්‍යාපෘතිවල සේවය කරනු ලබන අතර ඉතිරි 18 දෙනා අමාත්‍යාංශයේ සේවය කරනු ලබයි. | 25/2014 යටතේ බඳවාගෙන ඇති මෙම නිලධාරීන් අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගන්නා ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත වරින්වර දන්වා යවා ඇති අතර ඒ සඳහා වන අවසාන සිහිකැඳවීම 2021 ජනවාරි 26 දින යවා ඇත. | අදාළ නිලධාරීන් කාර්යමණ්ඩලයට ඇතුළත් කර කාර්යමණ්ඩල සීමාවන් සංශෝධනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතිවල සේවය කරනු ලබන කළමනාකරණ සේවා නිලධාරීන් 13 දෙනාගෙන් 09 දෙනෙකුගේ වැටුප් අමාත්‍යාංශය මගින් ගෙවා එම මුදල ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කරනු ලබයි. නිලධාරීන් දෙදෙනෙකු සඳහා අදාළ ව්‍යාපෘතිය මගින් වැටුප් ගෙවනු ලබයි. ව්‍යාපෘතිවල සේවය කරන අනෙක් කළමනාකරණ සේවයේ නිලධාරීන් දෙදෙනාට වැටුප් අමාත්‍යාංශය විසින් ගෙවනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ ගෙවා ඇති වැටුප්වල එකතුව රු.945,867කි. | මෙම නිලධාරීන් දෙදෙනා සේවා අවශ්‍යතාවය මත ව්‍යාපෘති සඳහා අනුයුක්ත කර ඇති බැවින් මෙම අමාත්‍යාංශය මගින් වැටුප් ගෙවනු ලබයි. | එම ව්‍යාපෘති යටතේ වියදම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2018 අගෝස්තු 06 දින, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියට කළමනාකරණ සහකාර ලෙස බඳවාගෙන තිබූ නිලධාරිනියගේ පත්වීම් දිනයේ සිට මේ දක්වා අතිරේක ලේකම් (ව්‍යාපෘති)ගේ පෞද්ගලික සහකාර ලෙස සේවයේ නිරත වී ඇත. ව්‍යාපෘතිය මගින් එම නිලධාරිනිය වෙත 2018 සහ 2019 වර්ෂ සඳහා රු.766,711ක් ද, 2020 වර්ෂය සඳහා රු.787,335ක් ද ලෙස රු.1,554,046ක් ගෙවා තිබුණි. | නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජයිකා ව්‍යාපෘතිවල සේවය කළ වෙනත් නිලධාරියෙකු නිදහස් කිරීම වෙනුවෙන් එම නිලධාරිනිය අමාත්‍යාංශය වෙත ලබා ගෙන ඇත. | ව්‍යාපෘතිය සඳහා බඳවාගත් නිලධාරිනිය එම ව්‍යාපෘතිය වෙත නිදහස් කළ යුතුය. |
| (ඈ) | අමාත්‍යාංශයේ ව්‍යාපෘති මෙහෙයුම් අංශයේ නිලධාරීන් සය දෙනෙකු වෙත රාජකාරි කටයුතු පැවරීම පිළිබඳ පරීක්ෂා කිරීමේදී කාලීනව වෙනස්වන රාජකාරි කටයුතුවලට අනුකූල වන පරිදි රාජකාරි ලැයිස්තු යාවත්කාලීන කර රාජකාරි පවරා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති මෙහෙයුම් අංශයේ සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් විධිමත් පරිදි යාවත්කාලීන කරන ලද රාජකාරි ලැයිස්තු නිකුත් කර ඇති අතර, එහි පිටපත් විගණනය වෙත ද ඉදිරිපත් කර ඇත. | රාජකාරි ලිඛිතව නිසි පරිදි පැවරිය යුතුය. |